**හෝමාගම ප්‍රාදේශීය සභාව**
**කොළඹ දිස්ත්‍රික්කය**

## 1. මුල්‍ය ප්‍රකාශන

### 1.1 මුල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මුල්‍ය ප්‍රකාශන 2020 මාර්තු 11 දින විගණනයට ඉදිරිපත්කර තිබූ අතර එම මුල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 සැප්තැම්බර් 25 දින ද විස්තරාත්මක කළමණාකරණ වාර්තාව 2020 ඔක්තෝබර් 16 දින ද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 අහිතකර මතය

මෙම වාර්තාවේ අහිතකර මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් ප්‍රාදේශීය සභාවේ 2019 දෙසැම්බර් 31 දිනට හෝමාගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයන් පිළිබිඹු නොකරන බව මා දරන්නාවූ මතය වේ.

### 1.3 අහිතකර මතය සඳහා පදනම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|---|
| (අ) | 2019 වර්ෂයේදී ඉදිකරන ලද වටිනාකම රු.23,459,116 ක් වූ ගොඩනැගිලි 09 ක පිරිවැය ගිණුම්ගතකර නොතිබුණි. | ගොඩනැගිලි ඉදිකිරීම් පිරිවැය ප්‍රාග්ධනිත කළ යුතු වීම. | 2019 වර්ෂයේදී ඉදි කරන ලද එම ගොඩනැගිලිවල පිරිවැය වන රු.23,456,116 ක් 2020 වර්ෂයේ අවසන් ගිණුම සකස් කිරීමේදී ප්‍රාග්ධනිත කරමි. |
| (ආ) | වර්ෂ 20 කට වඩා පැරණි හා පෙර වර්ෂවලදී වෙන්දේසි කරන ලද වටිනාකම රු.21,655,609 ක් වූ යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ, මෝටර් රථ හා කරත්ත සහ ලී බඩු සවිකිරීම්වල වර්තමාන භෞතික පැවැත්ම තහවුරු කර ගැනීමකින් තොරව ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර තිබුණි | වත්කම්වල වර්තමාන භෞතික පැවැත්ම තහවුරු කරගෙන ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කළ යුතුය. | නව ගිණුම් ක්‍රමය යටතේ සභාව සතු වත්කම්වල පැවැත්ම තහවුරු කරගෙන ප්‍රත්‍යාගණනය කර ගිණුමට ඇතුලත් කිරීමට කටයුතු සිදු කරගෙන යනු ලැබේ. |
| (ඇ) | භෞතිකව නොමැති රු.2,531,143ක් වටිනා ගබඩා භාණ්ඩ, ගබඩා තොග වශයෙන් තොග ගිණුමෙහි සටහන්කර තිබුණි. | වර්ෂය අවසාන දිනට භෞතික තොග ශේෂය ගණනය කර ගිණුම්වල දැක්විය යුතුය. | පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය (කොළඹ දිස්ත්‍රික්කය) මැදිහත්වීම මත 2012 වර්ෂයේ ලැබීම්, නිකුත් කිරීම් පමණක් සැලකිල්ලට ගෙන මෙම වෙනසින් කොටසක් හඳුනාගෙන ඇති අතර ඉදිරියේදී මෙම කාර්ය සඳහා කමිටුවක් පත්කර අදාළ තොරතුරු හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කරමින් පවතී. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | මීගොඩ ආර්ථික මධ්‍යස්ථානයේ භාරකාර මණ්ඩලයෙන් ලැබිය යුතු රු.141,750,000 ක් සඳහා ණයගැති ප්‍රතිපාදන සළසා නොතිබුණි. | අයවිය යුතු මුදල් ණයගැති ලෙස ගිණුම්ගත කළ යුතුය. | 2020 වර්ෂයේදී මෙම තොරතුරු ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේදී අපහරණය කරන ලද විකුණුම් වටිනාකම රු.77,018 ක් වූ භාණ්ඩවල පිරිවැය ගිණුම්වලින් ඉවත් කිරීමට කටයුතුකර නොතිබුණි. | විකුණන ලද භාණ්ඩවල පිරිවැය ගිණුම්වලින් ඉවත් කිරීමට කටයුතු කළ යුතුය. | චක්‍රලේඛ අංක LGD/09/2019(1) අනුව හඳුන්වා දුන් නව ගිණුම් ප්‍රමිත යටතේ ගිණුම් සකස් කිරීමේදී සියළුම වත්කම් නැවත ප්‍රත්‍යාගණනය කළ යුතු බැවින් 2020 වර්ෂය අවසාන වන විට ස්ථාවර වත්කම් ලේඛණ භෞතික පැවැත්ම තහවුරු කරගෙන යාවත්කාලින කළ හැකි වේ. |
| (ඊ) | ගිවිසුම් කාලය ඉක්මවීම නිසා අත්හැර දමන ලද කර්මාන්ත 02 ක් සඳහා රු.445,000 ක ණයහිමි ප්‍රතිපාදන ඇතිකර තිබුණි. | නිවැරදි කළ යුතුය. | 2020 වර්ෂයේ අවසන් ගිණුම සැකසීමේදී ණයහිමි ලේඛනයෙන් කපා හැරීමට කටයුතු කරමි. |
| (උ) | 2015 මාර්තු 25 දින සභා භූමිය තුළ පිහිටි ලේඛනාගාර ගොඩනැගිල්ල ගිනි ගැනීමෙන් සිදු වූ අලාභය රු.2,117,441 ක් ලෙස තක්සේරුකර තිබුණද, එය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | සියළුම තොරතුරු මූල්‍ය ප්‍රකාශන තුලින් අනාවරණය කළ යුතුය. | 2019 සැප්තැම්බර් සිට 2019 දෙසැම්බර් දක්වා ඔවුන් වෙත ගෙවීමට ඇති රු. 2,103,249 ක සේවා ගාස්තු හිලව් කර ගැනීමටත් ඉතිරි මුදල වන රු.14,192 ක මුදල ඔවුන්ගෙන් අයකර ගැනීටත් කටයුතු කරන බව දන්වා යවා ඇත. එසේම මේ සම්බන්ධයෙන් වන නෛතික කටයුතු තවදුරටත් අවසන් වී නොමැති හෙයින් අවසන් නියෝගයක් ලැබුණු වහාම එය ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ලැබේ. |
| (ඌ) | 2014, 2015 සහ 2016 වර්ෂවල ඉදිකල එකතු වටිනාකම රු.23,265,026 ක් වූ ප්‍රජාශාලා හා ආදාහනාගාරවල ඉදිකිරීම් පිරිවැය ගිණුම්ගත කර නොතිබුණි. | ගොඩනැගිලි ඉදිකිරීම් පිරිවැය ප්‍රාග්ධනිත කළ යුතුය. | 2014,2015 සහ 2016 වර්ෂ වල ඉදිකළ එකතු වටිනාකම රු.23,265,026 ක් වූ ප්‍රජා ශාලා හා ආදාහනාගාර වල ඉදි කිරීම් පිරිවැය ගිණුම්ගත කර නොතිබූ අතර එම වටිනාකම 2020 වර්ෂයේදී වත්කම් ලේඛනයට ඇතුලත් කිරීමට කටයුතු කරමි. |

### 1.3.2 නොසැසඳුනු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 08 ක එකතු වටිනාකම හා ඊට අදාල උපලේඛන වල එකතු වටිනාකම අතර රු.141,084,349 ක වෙනසක් විය. | ශේෂ නොසැසදීම් නිවැරදි කළ යුතු වීම | නිවැරදි තළ හැකි වෙනස් කම් 2020 වර්ෂයේදී නිවැරදි කරණ අතර සමහර ශේෂ වෙනස් කම් සඳහා හේතු සොයා ගැනීමට නොහැකි වී ඇත. |

### 1.3.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොමැති වීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වටිනාකම රු.446,262,801 ක් වූ ගිණුම් විෂයයන් 04කට අදාලව පිළිගත හැකි සාක්ෂි ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී ඒවා සතුටුදායක ලෙස සංනිරීක්ෂණය / සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. | අදාල උපලේඛන ඉදිරියේදී ඉදිරිපත් කරමි. |

### 1.4 අනුකූල නොවීම්

**නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

| නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) 1971 අංක 48 දරන පළාත් පාලන ආයතන පිළිබඳ විශේෂ විධිවිධාන පනත | වරිපනම් බදු අයකිරීම සඳහා සභා බලප්‍රදේශයේ සියළු නිශ්චල දේපල වර්ෂ 05 කට වරක් තක්සේරු කළ යුතු වුවත් හෝමාගම කලාපයේ වසර 09 කට පෙර ලබා ගත් තක්සේරුවක් පදනම් කරගෙන වරිපනම් බදු අයකර තිබුණි. | සියළුම නිශ්චල සහ චංචල දේපල කාලීනව තක්සේරු කිරීම. | හෝමාගම කලාපයේ වරිපනම් 2011 වර්ෂයේ සිදු කළ තක්සේරුව මත ක්‍රියාත්මක වේ. 2016 වර්ෂයේ සිට මෙම තක්සේරු ප්‍රතිශෝධන කටයුතු සිදුකර දෙන ලෙස තක්සේරු දෙපාර්තමේන්තුව මගින් ඉල්ලීම් කළ ඇති අතර එහි ප්‍රතිඵලයක් ලෙස 2019 වර්ෂයේ සිට තක්සේරු කටයුතු ආරම්භ කර ඇත.<br>එම තක්සේරු වාර්තාව 2020 සැප්තැම්බර් මාසයේ ලැබීමට නියමිත අතර නව තක්සේරුව 2021 වර්ෂයේ සිට ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරමි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) මු.රෙ 371 (5) | නිකුත් කළ අත්තිකාරම් රු.4,424,170 ක් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පෙර පියවා නොතිබුණි. | දෙන ලද අත්තිකාරම් අප්‍රමාදව පියවා ගැනීම | සොයා ගත නොහැකිව පවතින පෙර අත්තිකාරම් ශේෂයන් වේ. |

| | | | |
|---|---|---|---|
| (ii) මු.රෙ 571 | වර්ෂ 02ක ඉක්ම වූ තැන්පතු රු.34,147,021 ක් සම්බන්ධයෙන් කටයුතුකර නොතිබුණි. | කාලය ඉකුත් වූ තැන්පත් මු.රෙ. ප්‍රකාරව නොපමාව නිරවුල් කිරිම. | පිළිතුර 2020 වර්ෂයට අදාල වේ. |

(ඇ) චක්‍රලේඛ හා ලිපි
-------------------

| | | | |
|---|---|---|---|
| 1993 නොවැම්බර් 18 දිනැති නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් චක්‍රලේඛ අංක 15 | නාගරික සංවර්ධන අධිකාරි ගිණුමේ පවතින මුදල් හඳුනාගත් ව්‍යාපෘතියක් සඳහා යෙදවීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරගෙන නොතිබුණි. | ඵලදායි ව්‍යාපෘති සඳහා අරමුදල් යෙදවීම. | පුරනැගුම ව්‍යාපෘතිය මගින් ක්‍රියාත්මක කරන රථගාලේ පළමු මහළ ඉදි කිරීම සඳහා මෙම මුදල් යෙදවීමට 2019.09.19 වන දින මහ සභාවේ අංක 5:11 යටතේ යොජනාවක් සභා සම්මත වී ඇති අතර ඒ අනුව ඉදිරි කටයුතු සිදු කරමින් පවතී. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු.80,570,990 ක්වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු.134,926,783 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත්කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම් රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2019 ඇස්තමේන්තු ගත ආදායම | 2019 බිල්කළ ආදායම | 2019 රැස්කල ආදායම | 2019 දෙසැ.31 දිනට මුළු හිඟය | 2018 ඇස්තමේන්තු ගත ආදායම | 2018 බිල් කළ ආදායම | 2018 රැස්කළ ආදායම | 2018 දෙසැ.31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 |
| (i) වරිපනම් හා බදු | 87,110 | 82,397 | 80,770 | 40,896 | 74,088 | 83,423 | 64,897 | 38,466 |
| (ii) කුලී | 17,071 | 18,940 | 19,170 | 115 | 11,367 | 17,320 | 6,438 | 269 |
| (iii) බලපත්‍ර ගාස්තු | 5,401 | 4,989 | 5,088 | 12 | 4,101 | 5,269 | 2,849 | - |
| (iv) වෙනත් ආදායම් | 336,876 | 241,044 | 275,778 | 91,022 | 152,741 | 172,537 | 281,429 | 103,571 |
| එකතුව | 446,458 | 347,370 | 380,806 | 132,045 | 242,297 | 278,549 | 355,613 | 142,306 |

**2.2.2 වරිපනම් හා බදු**

**වරිපනම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු වරිපනම් රු.40,816,082 ක් වූ අතර ඒ තුල වර්ෂ 05 ට වැඩි කාලයක සිට පවතින රු.6,151,736 ක ශේෂයක් ද වර්ෂ 03 සිට 05 දක්වා පවතින රු.5,518,392 ක්ද වර්ෂ 01 සිට 03 දක්වා පවතින රු.22,510,060 ක්ද ඇතුලත්ව තිබුණි. | අයවිය යුතු වරිපනම් බදු අප්‍රමාදව අයකර ගත යුතුය. | ඉතිරි හිඟ මුදල් අයකර ගැනීම සඳහා ජංගම සේවා පැවැත්වූ අතර,හිඟ මුදල් අයකර ගැනීම සඳහා 2020.09.30 දිනට පෙර ගෙවීම් සිදු කරන ලෙස විධානය සභාව විසින් ලබා දී ඇති අතර දේපළ තහනම් කිරීමේ නිලධාරීන් වෙත හිඟ ලැයිස්තු ද ලබාදී ඇත.එසේම ඉදිරියේදී ජංගම සේවා පැවැත්වීමට ද දේපළ තහනම් කිරීමේ කටයුතු සිදු කිරීමට ද නියමිතය. |

**2.2.3** බදු කුලී

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| මීගොඩ ආර්ථික මධ්‍යස්ථාන භාරකාර මණ්ඩලය වෙත වාර්ෂික බදු කුලිය රු.300,000 කට පවරා තිබූ අක්කර 01 රූඩ් 02 පර්චස් 10 ක ප්‍රමාණයකින් යුත් ඉඩම් කොටස සඳහා 2013 වර්ෂයේදී කර තිබූ රු.900,000 ක් වූ නව තක්සේරු මුදල නොලැබීම හේතුවෙන් 2014 සිට 2018 දක්වා වර්ෂ වෙනුවෙන් ලැබිය යුතු හිඟ බදු මුදල හා දඩ මුදල රු.14,750,000 ක් විය. මේ සම්බන්ධයෙන් නීතිමය පියවර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි. | ලැබිය යුතු ආදායම් නොපමාව අයකර ගැනීමට කටයුතු කල යුතුය. | විගණනය විසින් පෙන්වා දී ඇති කාරණය පිළිගනිමි. මීගොඩ ආර්ථික මධ්‍යස්ථාන, භාරකාර මණ්ඩලය වෙත වාර්ෂික බදු කුලිය නොගෙවීම සම්බන්ධයෙන් නඩු පැවරීමේ කටයුතු සඳහා මේ වන විට සහා නීතිඥතුමා වෙත අදාළ තොරතුරු ලබාදී ඇත. |

2.2.4 **උසාවි දඩ**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරින්ගෙන් 2019 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.91,021,946 ක් විය. | ලැබිය යුතු ආදායම් නොපමාව අයකර ගැනීමට කටයුතු කල යුතුය. | මේ වන විට 2016 වර්ෂය දක්වා සියලුම උසාවි දඩ ගාස්තු උපලේඛනයන් වලට අදාළ සියලු මුදල් සාභාව වෙත ලැබී ඇත. එම තොරතුරු උපයෝගී කර ගනිමින් උසාවි ගාස්තු ගිණුම යාවත්කාලීන කර ගැනීම සඳහා මේ වන විට තොරතුරු යොමු කර ඇත. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත්, පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරනය, පහසුව හා සුහසාධන යන සභාව විසින් ඉටුකළ යුතුව තිබූ කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| හෝමාගම ෆයිසර් මුස්තාෆා කායවර්ධන මධ්‍යස්ථානයෙන් 2019 වර්ෂයේ රු.811,100 ක ආදායමක් උපයාගෙන තිබුණද, ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය ප්‍රකාරව පනවා ගත යුතු අතුරු ව්‍යවස්ථා 2019 දෙසැම්බර් 31 දින වන විටත් පනවාගෙන නොතිබුණි. | ආදායම් ඉපයීමට අතුරු ව්‍යවස්ථා පනවා ගත යුතු වේ. | ඊට අදාළ අතුරු ව්‍යවස්ථාව කෙටුම්පත් කර ඇති අතර අනුමැතිය සඳහා යොමු කිරීමට කටයුතු කරමින් පවතී. |

(ආ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| 2018 නොවැම්බර් 15 දින මහා සභාව විසින් කොම්පෝස්ට් අංගණයක් ඉදිකිරීමට තීරණයක් ගෙන තිබුණද 2019 දෙසැම්බර් 31 දිනවන විටත් ඒ පිළිබඳව ක්‍රියාත්මක වී නොතිබුණි. | අප්‍රමාදව කොම්පෝස්ට් අංගනය ඉදිකිරීමට ක්‍රියාමාර්ග ගත යුතුය. | කොම්පෝස්ට් අංගනයක් ඉදිකිරීමට තෝරාගනු ලබන ප්‍රදේශයන්හි මහජනතාව විසින් විරෝධතා දැක්වීම මෙම කටයුත්ත ප්‍රමාද වීමට හේතු විය. නමුත් මේ වන විට නාගරික සංවර්ධන අධිකාරිය සමග මේ සම්බන්ධයෙන් සාකච්ඡා කරමින් පවතී. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| වැතර උපකාර්යාලයේ මහජන පැමිණිලි ලේඛනය අනුව 2019 වර්ෂයේදී අනතුරුදායක ගස් පිළිබඳව පැමිණිලි 89 ක් සහ අනවසර ඉදිකිරීම් සම්බන්ධව පැමිණිලි 73 ක් ලැබී තිබුණු නමුත් එම පැමිණිලි ලැබුණු දිනය හා ගත් ක්‍රියාමාර්ග සම්බන්ධ තොරතුරු එහි සටහන් කර නොතිබුණි. | මහජන පැමිණිලි සම්බන්ධව අප්‍රමාදව ක්‍රියාමාර්ග ගත යුතුය. | වැතර උප කාර්යාලයේ මහජන පැමිණිලි, අනතුරුදායක ගස් සහ අනවසර ඉදිකිරීම් පිළිබඳ පැමිණිලි ලේඛනයන්හි අදාළ පැමිණිලි සම්බන්ධ තොරතුරු දැනට යාවත්කාලීන කරමින් පවත්වාගෙන යෑමට උපදෙස් දෙන ලදුව මේ වන විට ඒ අනුව කටයුතු කරමින් පවතී. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) සේවක පුරප්පාඩු හා අතිරික්ත | | |
| 2019 දෙසැම්බර් 31 දිනට අනුමත තනතුරුවල පුරප්පාඩු 16 ක් සහ අතිරික්ත 02 ක් පැවතුණි. | අත්‍යවශ්‍යපුරප්පාඩු සම්පූර්ණ කරවාගත යුතුය. | තාක්ෂණ නිලධාරි පුරප්පාඩු 01 ක් කොන්ත්‍රාත් පදනම මත පත් කර ඇත.<br><br>**ආදායම් පරීක්ෂක පුරප්පාඩු 01 -** අධිකරණයේ නඩුවක් පවතින බැවින් නැවත දන්වන තුරු බඳවා ගැනීම් සිදු නොකරන ලෙස දන්වා ඇත.<br>ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 16 න් 04 ක් රා.පරි.ව 25/2014 යටතේ සිදු කළ බඳවා ගැනීම් වලට අයත් වේ.<br><br>**රියදුරු පුරප්පාඩු 01** අයදුම්කරුවෙකු නිර්දේශ වී ප්‍රායෝගික පරීක්ෂණයකට යොමු කිරීමට නියමිතය. |
| (ආ) සේවක ණය | | |
| 2019 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු සේවක ණය ශේෂය තුළ විශ්‍රාම ගිය, සේවය හැර ගිය හා ස්ථාන මාරුවීම් ලද 28 දෙනෙකුගෙන් අයවිය යුතු රු.1,522,985 ක් විය. | හිඟ සේවක ණය ශේෂයන් අප්‍රමාදව අයකරගත යුතුය. | 2019 දෙසැම්බර් 31 දිනට අය විය යුතු විශ්‍රාම ගිය, සේවය හැර ගිය හා ස්ථාන මාරුවීම් ලද 28 දෙනෙකුගෙන් අයවිය යුතු රු.1,522,985 ක ණය මුදල් අප්‍රමාදව අයකර ගැනීමට ඉදිරියේදී කටයුතු කරමි. |

**3.4 මතභේදයට තුඩුදුන් ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| (අ)පෙරමුසු නිෂ්පාදනය කිරීම හා මාර්ගවල ඇතිරීම | | |
| 2018 වසරේ සභා තීරණයක් මගින් මාර්ග නඩත්තු කිරීම සඳහා අවශ්‍ය පෙරමුසු නිෂ්පාදනය කර ඇතිරීමේ කොන්ත්‍රාත්තුව බාහිර ආයතනයකට පවරා දීමට තීරණය කර තිබුණි. මෙහිදී 2019 වර්ෂයටද මිල රේටයන් වෙනස්කර එම ආයතනය වෙතම මාර්ග නඩත්තු කිරීම හා පෙරමුසු නිෂ්පාදන කොන්ත්‍රාත්තුව පවරා තිබුණි.2019 වර්ෂයේ දී අමුද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා රු.16,031,716ක් හා බලප්‍රදේශයේ කාපට් නොවන අතුරු මාර්ග වල වලවල් වැසීම සඳහා පෙරමුසු තාර කියුබ් 217 ක් මිලදී ගැනීම සඳහා රු.1,653,456 ක් ද වැයකර තිබුණු අතර නිෂ්පාදනය කර ඇතිරීම | සභාව සතු කම්කරුවන් යොදා අරපිරිමැසුම් දායකව කටයුතු කළ යුතුය. | අමුද්‍රව්‍ය මිලදී ගැනීමේදී, සැපයුම්කරුවන් විසින් ඉදිරිපත් කර ඇති මිල ගණන් සලකා කමිටු නිර්දේශ පරිදි කටයුතු කර ඇත.<br>අප සභාව සතුව ප්‍රමාණවත් රථ වාහන හා යන්ත්‍රෝපකරණ නොමැති හෙයින් මෙම කටයුතු සඳහා කොන්ත්‍රාත්කරුවන් යෙදවීම සිදුකර ඇත. |

සඳහා රු.10,384,665 ක් කොන්ත්‍රාත්කාර සමාගම වෙත ගෙවා තිබුණි.

මෙහිදී සභාව සතු පෙරමුසු භූමිය පරිහරණයෙන් සභාවේ සම්පත් උපයෝගී කර සිදුකර ගත හැකිව තිබුණු කාර්යයන් බාහිර පාර්ශවයකට පැවරීම හේතුවෙන් මේ සඳහා රු.10,384,665 ක අතිරේක වැයක් දැරීමට සිදුව තිබුණි.

(ආ) පිරිසිදු කිරීමේ සේවාව ලබා ගැනීම
---------------------------------------

| | | |
|---|---|---|
| හෝමාගම ප්‍රධාන කාර්යාලය, වැතර උපකාර්යාලය, විල්ෆ්‍රඩ් සේනානායක ක්‍රීඩාංගණයේ කායවර්ධන මධ්‍යස්ථානය හා පොදු වෙළඳ සංකීර්ණය පිරිසිදු කිරීම වෙනුවෙන් පෞද්ගලික ආයතනයකට 2019 වර්ෂය තුළදී රු.1,926,900 ක් ගෙවා තිබුණි. සභාවෙන් වැටුප් ලබන සෞඛ්‍ය කම්කරුවන් 44 දෙනෙකු සිටියදී වෙනත් ආයතනයක් වෙත ගෙවීම් කිරීම ඵලදායී බවින් තොර ගනුදෙනුවක් විය. | සභාවට වාසිදායක වන අයුරින් කටයුතු කළ යුතුය. | ආයතන පරිශ්‍රය පිරිසිදු කිරීම සඳහා ආයතනයේ සෞඛ්‍ය කම්කරුවන් යෙදවීම අපහසු බැවින් බාහිර ආයතනයකින් සේවාව ලබා ගැනීමට සිදු වී ඇත. සෞඛ්‍ය කම්කරුවෙක් සඳහා රු.1,200ක දෛනික දීමනාවක් ගෙවන ලබන අතර, පිරිසිදු කිරීමේ කටයුතු සඳහා සේවකයන් පස්දෙනෙකුට දිනකට රු.6,000 ක් ගෙවීමට සිදුවේ. පිරිසිදු කිරීමේ බාහිර ආයතනයට දිනකට කම්කරුවන් පස්දෙනෙක් සඳහා ගෙවනු ලබන්නේ රු.6,520 කි. සභාවේ සේවකයෙක් යොදවන්නේ නම් පිරිසිදු කාරක ද්‍රව්‍ය ද සභාව විසින් සැපයිය යුතුව ඇත.<br>එම ආයතනය සඳහා ගෙවනු ලබන රු. 6,520 ක මුදල තුළ පිරිසිදු කාරක ද්‍රව්‍ය සඳහා වන වියදම ද ඇතුළත් වේ. එම නිසා සභාවට පාඩුවක් සිදු වී නොමැති බව කාරුණිකව සඳහන් කරමි. |

**3.5 වත්කම් කළමනාකරණය**
---------------------------

**3.5.1 වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම**
---------------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| පොදු පහසුකම් ඉඩම් ලෙස සභාවට ලැබුණු වර්තමානයේදී පෞද්ගලික පාර්ශවයන් විසින් භුක්ති විඳිනු ලබන ඉඩම් කැබලි 09 ක් සම්බන්ධයෙන් ආරක්ෂණ වැටවල් සකස්කර සහා පාලනයට ගැනීමට ක්‍රියාකර නොතිබුණි. | සභාව සතු ඉඩම්වල ආරක්ෂාව තහවුරු කිරීමට පියවර ගත යුතුය. | පොදු පහසුකම් ඉඩම් සඳහා නාම පුවරු සකස් කරමින් පවතී. |

### 3.5.2 නිශ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
| --- | --- | --- |
| (අ) එකතු වටිනාකම රු.6,146,250 ක් වූ අත්ට්‍රැක්ටරය උපයෝගී කරගෙන සෑදූ විදුලි උත්පාදක යන්ත්‍රයක්, මෝටර් ග්‍රේඩරයක්, රෝද 4 කුඩා ට්‍රැක්ටරයක් , ටෙලර් යන්ත්‍ර 03ක් හා යකඩ රාක්ක 03 ක් නිශ්ක්‍රීයව පැවතුණි. | සම්පත් වලින් උපරිම ප්‍රයෝජන ගැනීම හෝ අපහරණය කිරීම | වෙන්දේසි කිරීමට අවශ කටයුතු සිදුකරමින් පවති |
| (ආ) සභාවේ පොදු අරමුදල් හා පළාත් සභා ප්‍රතිපාදන රු.3,248,058 ක් වැයකර 2011 වර්ෂයේදී ඉදිකරන ලද පිටිපන නව පුස්තකාල දෙමහල් ගොඩනැගිල්ල කිසිදු ප්‍රයෝජනයක් නොගෙන ඌන උපයෝජිතව පැවතුණි. | සම්පත් වලින් උපරිම ප්‍රයෝජන ගැනීමට කටයුතු කළ යුතුය. | පිටිපන නව පුස්තකාල දෙමහල් ගොඩනැගිල්ල පෙර පාසලක් පවත්වාගෙන යෑම සඳහා ගිවිසුම්ගතව ලබාදී ඇත. |

### 3.6 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
| --- | --- | --- |
| (අ) ප්‍රධාන කාර්යාලයේ ගබඩාවේ තිබූ වටිනාකම රු.198,588ක් වූ කොඩි කණු 201 ක් ඌනව තිබුණි. | ඌණතාවයට හේතු සොයා වගකිව යුත්තන්ගෙන් අයකිරීමට පියවර ගත යුතුය. | පොලීසියට පැමිණිළි කර, සිහිකැඳවීම් යවා හා වාචිකව දැනුවත් කර ඇත. |
| (ආ) 2019 වර්ෂයේදී වැතර උපකාර්යාලයේ සේවකයින් 04 දෙනෙකුගෙන් වැටුප් රහිත නිවාඩු සඳහා අයකළ යුතු රු.118,360ක් අයකර ගෙන නොතිබුණි. | වැටුප් රහිත නිවාඩු සඳහා අයකිරීම් කළ යුතුයි. | වැතර උප කාර්යාලයේ සේවකයින් 04 දෙනෙකු 2019 වර්ෂයේ දී ලබාගෙන ඇති වැටුප් රහිත නිවාඩු වෙනුවෙන් රු.118,360 ක මුදලක් වැටුපෙන් අය කළ යුතු බව දක්වා ඇතත් එකී දින ගණනයේදී යම් ප්‍රමාද දෝෂයක් සිදුව ඇති බැවින් එය රු.90,632 ලෙස සංශෝධනය විය යුතුය. |

## 4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
| --- | --- | --- |
| 2019 වර්ෂය සඳහා ඉදිකිරීම් කර්මාන්ත, ගිවිසුම්ගත සේවා ලබා ගැනීම, පොදු පහසුකම් ඉඩම්, සභාවට අයත් වත්කම් හා සැලසුම් අනුමත කිරීම සම්බන්ධයෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | කාර්යක්ෂම අභ්‍යන්තර විගණනයක් ක්‍රියාත්මකකල යුතුය. | 2019 වර්ෂයේදී අභ්‍යන්තර විගණනය නිලධාරීන් තිදෙනෙකු මාරු වී යෙදවීම නිසා නොකඩවා කටයුතු කිරීමට ප්‍රයෝගිකව නොහැකි විය. |